සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

**තෙවන වාර පරීක්ෂණය 2016** **10 ශ්‍රේණිය**
மூன்றாம் தவணைப் பரீட்சை **2016** தரம் **10**
**Third Term Test 2016** **Grade 10**

**තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය I I**
**தகவல் மற்றும் தொடர்பாடல் தொழிநுட்பம் I I**
**Information and Communication Technology I I**


**පැය දෙකයි**
***Two hours***
**மூன்று மணித்தியாலம்**

- පළමු ප්‍රශ්ණය ඇතුළු ප්‍රශ්ණ 5කට පමණක් පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්ණය සඳහා ලකුණු 20ක්ද අනෙකුත් සෑම ප්‍රශ්ණයක් සඳහාම ලකුණු 10 බැගින්ද හිමිවේ.

---

1)

I. පහත දැක්වෙන රූප සටහන මගින් විශාලත්වය අනුව පරිගණක වර්ග කිරීමක් නිරූපණය වන්නේ නම් A, B, C හා D සඳහා උචිත පදයන් ලියන්න.




A ..............................

B ..............................

C ..............................

D ..............................

II. ප්‍රථම වරට චිත්‍රක පරිශීලක අතුරුමුහුණතක් සහිත මෙහෙයුම් පද්ධතියක් ඇති පරිගණකයක් දැකිය හැකි වන්නේ කුමන පරම්පරාවේද?

III. සංස්කරණය කළා වූ තොරතුරු පරිගණක පද්ධතියක් තුළින් පිටතට ලබා දෙන ආකාර (Output) 3 ලියන්න.

IV. $15D_{16}$ යන ෂඩ් දශමය සංඛ්‍යාව දශමය සංඛ්‍යාවක් බවට පරිවර්තනය කරන්න. (පියවර ලියා දක්වන්න.)

V. පහත A වගුවෙහි විස්තර කරන දේ සඳහා උදාහරණ B වගුවෙන් තෝරන්න. (1, 2, 3, 4 හි පිළිතුරට අදාළ අක්ෂරය ලිවීම ප්‍රමාණවත් වේ.)

| A | |
|---|---|
| 1 | විවෘත මෘදුකාංගයකි. |
| 2 | ලොව පළමු යාන්ත්‍රික ගණක යන්ත්‍රය. |
| 3 | වඩා දීප්තිමත් පරිගණක තිරය. |
| 4 | ඝන තත්වයේ මතක උපාංගයකි. |

| B | |
|---|---|
| A | Adding Machine. |
| B | Hanthana Linux. |
| C | Secure Digital Card. |
| D | Light Emitting Diaode. |

VI. තොරතුරු හුවමාරුවේදී නාභිය ක්‍රියාත්මක වන්නේ ........................... විධි ක්‍රමයට වන අතර, ස්විචය ........................ විධි ක්‍රමයට ක්‍රියා කරයි. (හිස්තැනට සුදුසු පද ලියන්න.)

VII. $\overline{(\bar{A}.C)} + B$ යන බූලීය වීජ ප්‍රකාශනයට අදාළ තාර්කික පරිපථය අඳින්න.

ictnotes.org

VIII. = 16/4*5-2^3+8 මෙම සූත්‍රය පැතුරුම්පත් කෝෂයක් තුළ යතුරු ලියනය කිරීමෙන් ලබා ගත හැකි පිළිතුර කුමක්ද?

IX. දත්ත සමුදාය කළමණාකරනයේදී දත්ත සමරික්තතාව (Data Redundancy) ලෙස හැඳින්වෙන්නේ කුමක්ද?

X. මූලික තාර්කික ද්වාර සම්බන්ධ කිරීමෙන් සාදන සංයුක්ත තාර්කික ද්වාර 2ක් ලියන්න.

2.)

I. $79_{10}$, 385 යන දශමය සංඛ්‍යා ද්වීමය, අෂ්ටමය හා ෂඩ් දශමය පාදවලට හරවන්න. (පියවර ලියා දක්වන්න.) (ල.3)

II. සේවාදායක පරිගණක කාමරයට ඇතුලත් වීම සඳහා ආරක්ෂක පද්ධතියක් සවිකර ඇත.එහි දොර විවෘත කිරීම සඳහා ප්‍රධාන ජාල පාලකගේ ඇඟිලි සළකුණ (A) හෝ පළමු නියෝජ්‍ය ජාල පාලක (B) සහ දෙවන නියෝජ්‍ය ජාල පාලක (C) යන දෙදෙනාගේ ඇඟිලි සළකුණු දෙක ලබා දිය යුතුය.


| | |
|---|---|
| ඇඟිලි සළකුණ ලබා දීම | 1 |
| ඇඟිලි සළකුණ ලබා නොදීම | 0 |
| දොර විවෘත වීම | 1 |
| දොර විවෘත නොවීම | 0 |

a) ඉහත කාර්ය සඳහා තාර්කික පරිපථය අඳින්න. (ල.3)

b) ඉහත තාර්කික පරිපථය සඳහා සත්‍යතා වගුව නිර්මාණය කරන්න. (ල.4)

iii.

3.) පහත දැක්වෙන්නේ පරිගණක අලෙවි සැලක ප්‍රචාරණ දැන්වීමකි.




ictnotes.org

I. A, B, C, D අක්ෂර වලින් පෙන්වා ඇති ආකාරයට සකස් කර ගැනීම සඳහා වදන් සැකසුම් මෘදුකාංගයේ ඇති පහසුකම් මොනවාද? (ල.2)

II. වදන් සැකසුම් නිදහස් හා විවෘත මෘදුකාංග (Free and Open source) 2ක් නම් කරන්න. (ල.2)

III. මෙම දැන්වීම කිහිපදෙනෙකුට යැවීම සඳහා ලියුම් කවර සකස් කිරීමට වදන් සැකසුම් මෘදුකාංග වල දී ඇති පහසුකම කුමක්ද? (ල.2)

IV. ඔබගේ පරිගණකයේ වදන් සැකසුම් මෘදුකාංගයක් ස්ථාපිත කර නැත්නම් අන්තර්ජාලය භාවිතයෙන් ඉහත ලේඛණය නිර්මාණය කර ගැනීමට යොදාගත හැකි මෘදුකාංග 2 නම් කරන්න. (ල.2)

V. ඉහත දැන්වීම පරිගණකයේ page 03 ලෙස තැම්පත් කළ විට තැම්පත් වන්නේ කුමන ගොනු දිගු නාමයෙන්ද? (ල.2)

4.) පහත දැක්වෙන්නේ එක්තරා පාසලක 10 ශ්‍රේණියේ සිසුන්ගේ 2 වන වාර විභාගයේ ලකුණු ඇතුලත් පැතුරුම්පත් කොටසකි.

| | A | B | C | D | E | F | G |
|---|---|---|---|---|---|---|---|
| 1 | Name | Maths | ICT | Science | Total | Average | Rank |
| 2 | Nimal | 80 | 85 | 69 | | | |
| 3 | Amal | 67 | 90 | 70 | | | |
| 4 | Saman | 70 | 80 | 81 | | | |
| 5 | Kamal | 80 | 75 | 78 | | | |
| 6 | Asiri | 85 | 80 | 71 | | | |
| 7 | Min | | | | | | |
| 8 | Max | | | | | | |

I. ඉහත වගුවේ නිමල්ගේ විෂයන් සඳහා ලබාගත් ලකුණු වල එකතුව E2 කෝෂයට ඇතුලත් කිරීම සඳහා අවශ්‍ය නිවැරදි ශ්‍රිතය (formula) දක්වන්න. (ල.2)

II. E2 කෝෂයට ඇතුලත් කර ඇති ශ්‍රිතය (formula) E3 කෝෂයට පිටපත් කල විට එම සූත්‍රය E3 කෝෂයෙහි පෙන්නුම් කරන්නේ කෙසේද? (ල.2)

III. ICT විෂය සඳහා ශිෂ්‍යයන් ලබාගත් අඩුම අගය C7 කෝෂය සඳහා ලබා ගැනීමට යොදාගත හැකි ශ්‍රිතය කුමක්ද? (ල.2)

IV. එක් එක් ශිෂ්‍යයා විෂයන් සඳහා ලබාගත් ලකුණු පෙන්වීමට යෝග්‍ය වන පැතුරුම්පත් මෘදුකාංගයේ ඇති ප්‍රස්ථාර වර්ගය (Chart type) යෝජනා කරන්න. (ල.2)

ictnotes.org

V. මෙබඳු ගණනය කිරීම් සඳහා පැතුරුම්පත් මෘදුකාංගයක් යොදා ගැනීමේ වාසි 4ක් ලැයිස්තුගත කරන්න. (ල.2)

5.)

i) පරිගණකයක අත්‍යාවශ්‍යම මෘදුකාංගය මෙහෙයුම් පද්ධතියයි. ඔබ එකඟ වන්නේද? ඔබේ පිළිතුරට හේතු දෙකක් ලියන්න.(ල.3)

ii) පරිගණක පද්ධතියක දෘඩාංග පාලනය කිරීම සඳහා භාවිතා වන කළමණාකරනයන් 4ක් ලියන්න. (ල.2)

iii) පහත මෙහෙයුම් පද්ධති සඳහා භාවිතා වන ගොනු ආකෘති තෝරා ලියන්න. (ල.3)
(NTFS, FAT16, ext4)

1. MSDOS
2. Windows 8
3. Ubuntu

iv) පහත ගොනු හා ෆෝල්ඩර් මෙහෙයුම්, අදාළ පිළිවෙළට නොමැත. එහි නිවැරදි පිළිවෙළ ඉංග්‍රීසි අක්ෂර පමණක් ලියා දක්වන්න.

A. පිටපත් කල යුතු ධාවකයන්
B. Paste විධානය ලබාදෙන්න.
C. පියපත් කළ යුතු ගොනුව/ෆෝල්ඩරය තෝරාගන්න.
D. පිටපත් කිරීමට copy විධානය ලබා දෙන්න.

6.) Road king බස් සමාගමේ බස් රථ සහ සේවකයන් පිළිබඳ තොරතුරු ඇතුලත් දත්ත සමුදායක් පහත දැක්වේ. එයට අදාලව අසා ඇති ප්‍රශ්ණ වලට පිළිතුරු සපයන්න.

Bus වගුව

| Bus No | Seats | Route-No | Route- Name |
|---|---|---|---|
| NP5000 | 52 | 122 | COL - RAT |
| NP5001 | 40 | 470 | AVI-RAT |
| NP5002 | 52 | 490 | EMB-RAT |
| NP5003 | 40 | 450 | PAN-RAT |

Driver වගුව (රියදුරු වගුව)

| DR_NAME | DR_ID | BUSNO |
|---|---|---|
| Saman | 7580 | NP5000 |
| Nimal | 6095 | NP5001 |
| Kamal | 2009 | NP5002 |
| Saman | 6609 | NP5000 |
| Jeewan | 3051 | NP5002 |

ictnotes.org

Conductor වගුව (කොන්දොස්තර වගුව)

| CON_NAME | CON_ID | BUSNO |
|---|---|---|
| Ranil | 8021 | NP5000 |
| Sunil | 7129 | NP5003 |
| Ruwan | 5201 | NP5001 |
| Sisira | 5900 | NP5002 |
| Ravimal | 5921 | NP5003 |

i) වගු තුන සඳහා ප්‍රාථමික යතුරු වගුවේ නම සමඟ ලියන්න. (ල.3)

ii) ඉහත ආයතනය දත්ත සමුදාය සඳහා එක් වගුවක් භාවිත කළේ නම් මුහුණ පාන අපහසුතා 2ක් ලියන්න. (ල.2)

iii) Road king සමාගමේ අයිතිකරු නව බස් රථයක් මිලදී ගත්තේය. ආසන 52ක් සහිත ඇඹිලිපිටිය - රත්නපුර මාර්ගය සඳහා එය යොදා ගනී.

A. කුමන වගුව යාවත්කාලීන කල යුතුද?

B. යාවත්කාලීනන කිරීමට අදාල රෙකෝඩය ලියා දක්වන්න. (ල.3)

iv) ඉහත ආකාරයේ දත්ත සමුදාය සැකසීම සඳහා භාවිතා තල හැකි මෘදුකාංග 2ක් ලියන්න. (ල.2)

ictnotes.org